
# බබළු



ශේන්යා මිහෙළී විජේසිංහ

# පිදුම

මගේ අත්තම්මා ට ආදරයෙන්...



කෘතියේ නම :  බබල්

කර්තෘ ගේ නම : ශේන්යා මිහෙළි විජේසිංහ

2025.01.26

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,


මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එදා මගේ නවවැනි උපන්දිනය යෙදුනු දවස. අයියලා පාට පාට බැලුන් බෝල එල්ලල කෑම කාමරය ලස්සනට සැරසුවා. අම්මා ලස්සනම ලස්සන කේක් එකක් හැදුවා. අත්තම්මාගෙ කැවුම් සුවද මුළු ගෙදරම පිරිලා. මේසය පුරාම එක එක රස කෑම ජාති වලින් පිරිල. උපන්දින සාදයට දැන් සියල්ල සූදානම්.

තාත්ත අද ටිකක් පරක්කුයි. අයියල දෙන්නයි මායි තාත්ත එනකල් පාර දිහා බලාගෙන හිටියා. "අන්න නංගී... තාත්තා ආවා" ලොකු අයියා කෑගැහුවා. මං තාත්තා ළඟට දිවුවා. තාත්තගෙ අතේ පොඩි කාර්ඩ්බෝර්ඩ් පෙට්ටියක්. "මේ මොකක්ද තාත්තෙ මේ? "මං ඇහුවා."මේ සුදු මැණිකෙට ගෙනාපු උපන්දින තෑග්ග. ගෙට ගිහින් ඇරලා බලමු "තාත්තා කිවුවා. තාත්තා පෙට්ටිය සාලයේ මේසය උඩින් තිබ්බා.

"එන්නකෝ පුතාට ගෙනා තෑග්ග පෙන්වන්න" තාත්තා සතුටින් කිවුවා.

මමයි, අම්මයි, අයියලයි, අත්තම්මයි, අපි හැමෝම තෑග්ග බලන්න වට උනා. තාත්තා හෙමිහිට පෙට්ටිය ඇරියා. ලොකු දෙයක් පේන්න තිබුණේ නැහැ. "කෝ තාත්තේ තෑග්ග" මං ඇහුවා. "පෙට්ටිය අඩියේ බලන්නකෝ" තාත්තා කිවුවා.




අනේ! චූටිම චූටි ඉබි පැටියෙක්. අපි හැමෝටම පුදුමයි. තාත්තා උගව අතට අරගෙන මේසෙ උඩින් තිබ්බා. අපේ තාත්තාගේ අත් ඔරලෝසුවේ මූණත තරම් උග පුංචියි. උගට ලා කහ පාටට හුරු කොළ පාට පිටේ පුල්ලි වැටුණු මෝස්තරයක් සහිත කටූටක්, චූටිම චූටි කකුල් හතරක්, කළු පාටින් දිලිසෙන බෝල ඇස් දෙකක් එක්ක පුංචිම පුංචි හිසක් සතුයි. මුලදි සද්ද නැතුව ඉඳලා, හෙමිහිට චූටි බෙල්ල හරව හරව එහෙ මෙහෙ බැලුවා.

"පුතේ මේ පුංචි ඉබ්බා හුරලතලේට ඇතිකරන්න අළුතින් බෝකරන සත්තු ජාතියක්. මෙයාලා ලොකුවට කෑම කන්නේ නැහැ. මාළු කෑම තමයි මෙයාට දෙන්න වෙන්නේ." තාත්තා කිව්වා. ආ... ඒ ටිකට අපට උපන්දින සැමරුමත් අමතක වෙලා.

"හොඳයි, දැන් හැමෝම තේ බීලා නංගිට උපන්දිනේට සුබ පතමු." අම්මා කිව්වා.



අපි අම්ම හදපු රසම රස කේක් කාලා තේ බීලා ඉබි පැටියට ඉන්න තැනක් ලැහැස්ති කරන්න පටන් ගත්තා. අයියලා දෙන්නට හරිම කලබලේ. ලොකු බේසමක් සෝදලා, වතුර ටිකක් දාලා ගල් කැට ටිකකුත් තියලා, ඉබි පැටියා වතුරේ තිබ්බා විතරයි. ඌ චූටි කකුල් ගහ ගහ පීනන්න ගත්තා. අපිට හරිම සතුටුයි. අයියලා යේ යේ කියකියා අත්පුඩි ගහමින් සිනාසුනා.



"අපි මෙයාට නමක් දාමු නේද? "අම්මා කිව්වා.

චුට්ටා, ඉබිපුංචා, කලබලපුංචා, පෝටබල් වගේ නම් අයියලා යෝජනා කළා. ඒ අතරේ මම බේසමට එබිලා බලාගෙන හිටියා. එයා පුංචි වායු බුබුලක් කටින් දානවා මම දැක්කා."තාත්තේ අපි මෙයාට 'බබල්' කියමු." මම යෝජනා කළා. හැමෝම ඒ නම ස්ථිර කළා. එදා ඉඳලා එයා බබල්. මගේ චූටි සුරතල් බබල්.

බබල් මට ලැබුණු තෑග්ග වුණාට අපි හැමෝම එයාට ආදරෙයි. එයා අතට ගන්න අපි පුරුදු වුනා. තාත්තත් ගෙදර ආවම බබල් අතට අරගෙන හුරතල් කරනවා. අම්මයි අත්තම්මයි එයාගේ හුරතල් බැලුවට එයාව අල්ලන්න නම් කැමති නෑ.

දැන් නම් මට බබල්ව දාල ඉස්කෝලෙ යන්නවත් හිතෙන්නෙ නැති තරම් ඒ තරමටම බබලුයි මායි යාලුයි. මං උදේ නැගිට්ටම එයා ළඟට ගිහින් බේසමේ වතුර මාරු කරලා කෑම දීලා තමයි ඉස්කෝලෙ යන්න ලැහැස්ති වෙන්නෙ. ඉස්කෝලෙ ඇරිල ගෙදර ආවමත්

එයාව බලල කෑම දීලා ටික වෙලාවකට එළියට අරගෙන සුරතල් කරලා තමයි ආයෙමත් බේසමෙන් තියන්නේ.

ගෙදරදී කරන ඉස්කෝලෙ වැඩ ඉවර වුණාට පස්සේ මම බබල් එක්ක තමයි කාලය ගත කරන්නෙ. නිතරම මගේ අතේ ඉන්න නිසා, එයා මගේ අතට එන්න හරිම ආසයි. අතට ආවම බෙල්ල දිග්කරගෙන මගෙ දිහා බලාගෙන ඉන්නවා.



එයාගෙ කකුල්වලත්, බෙල්ලේත් හම හරිම සිනිඳුයි, සීතලයි. බබල් සාලයේ බිම තිබ්බම බෙල්ල දික් කරගෙන එහෙ මෙහෙ වේගයෙන් ඇවිදින්න පටන් ගන්නවා. අපිට හරිම හිනහයි. "පුතේ, හා පැටියෙකුත් ගෙනල්ලා දිවීමේ තරගයට දාමු නේද?" කියලා අත්තම්මා විහිලුවට කියනවා.



මම ළඟදී බබල්ට ගෙයක් හැදුවා. පොඩි කාර්ඩ්බෝඩ් පෙට්ටියක පාට පාට කොළ අලවලා ජනෙල් දොරවල් දාලා ගෙදරක් හැදුවා. ගේ ඇතුලට යන්න පුරුදු කරා. දැන් එයා ගේ දොරකඩ ළඟ තිබ්බම ගේ ඇතුලට රිංගන්න පුරුදු වෙලා. මම හුඟාක් වෙලාවට පාසල් වැඩ කරන්නේ බබල් එක්ක පෙට්ටිය මේසය උඩ තියාගෙන. එයා හොරා වගේ දොරෙන් එබිලා මං දිහා බලාගෙන ඉන්නවා. බබල් ගෙ අහිංසක කමට මං හරි ආසයි.



ඉබ්බෝ කොළ කන්න කැමති කියලා අත්තම්මා කීව නිසා, මං එයාට ගෝවා කොළ, සලාද කොළ දුන්නා. ඒත් එයා ඒවා දිහා බැලුවේ වත් නෑ. මාළු කෑම ඇට දුන්නම පැන පැන කනවා. ඒවාට නම් හරි ආසයි.

සති අන්තයට බබල්ට සලකන්න මම කාලය ගන්නවා. පරණ දත් බුරුසුවකින් එයාගෙ පිට හෙමින් මැදලා එයාව නාවලා තුවායකින් ඇඟ පිහිදමනවා. ඒ වැඩ කරන කොට එයා සනීපෙට ඉන්නවා.

"අනේ මේ දරුවාට වෙන වැඩක් නැහැ මේ ඉබ්බෙක් හින්දා. අනේ තියන් හිටියට කමක් නෑ. කෑම කන්න කලින් හොඳට සබන් ගාලා අත් දෙක සෝදගන්න ඕනේ, තේරුණාද?" අත්තම්මා ටිකක් සැරෙන් කියනවා. එතකොට මට බබල් ගැන දුකයි. බබල්ට තවත් ආදරේ හිතෙනවා.



අවුව තියෙන වෙලාවට කුස්සිය ළඟ තණකොළ ගොල්ලේ බබල්ව තියලා බලාගෙන ඉන්න මම ආසයි. එයා තණකොළ අස්සෙ රිංග රිංග කලබලේට යනවා. සමහර වෙලාවට හොයාගන්නත් අමාරුයි.

අපේ ගෙදරට බබල් ගෙනල්ලා දැනට මාස හතරක් විතර වෙනවා. ඒත් එයා ලොකු වෙලා නැහැ. ඒ වුණාට හුඟක් දඟ වෙලා.



එදා සෙනසුරාදා දවසක්. ඉර පායලා හොඳට අවුව තිබුණා. මම බබල් නාවලා කුස්සිය ළඟ තණකොළ ගොල්ලේ තිව්වා, එයාට අවුව තපින්න. බබල් පිස්සා වගේ එහෙ මෙහෙ ගියා. තණකොළ අස්සෙ රිංගුවා.

"මෙන්න පුතේ ඔයාගේ යාලුවා සනුති ඇවිල්ලා," අම්මා කෑගැහුවා. මම සනුති බලන්න ගේ දොරකඩ ළඟට දිව්වා. "යමු සනුති මගෙ බබල් බලන්න." කියලා සනුතිගෙ අතින් අල්ලාගෙන තණකොළ ගොල්ලට දිව්වා.

බබල් සිටි තැන බැලුවා. අනේ එයා නැහැ."අම්මේ බබල් නැතිවෙලා. හැංගිලාද කොහෙද " මම අම්මාට කතා කළා. හැමෝම දුවගෙන ආව. හැමෝම බබල්ටව හෙව්වා. හොයාගන්න බැරිවුණා.

එයා නැතිවෙලා. අනේ මගේ බබල් පැටියා! මට හයියෙන් ඇඬුණා." අනේ අපොයි අහිංසකයා." අත්තම්මා කියනවා මට යන්තමට ඇසුනා.

සනුහි ලා ගියාට පස්සෙත් අපි හැමෝම තණකොළ ගොල්ල පීර පීරා බබල්ව හෙව්වා.බැරිම තැන බිම වාඩිවෙලා මම හොඳටම ඇඬුවා.

"අනේ මගෙ බබල් ඔයා නැතුව මට දුකයි පාළුයි, කොහෙද මාව දාලා ගියේ" මගේ කම්මුල් දිගේ කඳුලු බේරුනා. එදා රෑ මට නින්ද ගියේ නැහැ. බබල්ව මතක් වෙවී ඇඬුනා. මම ඉකිගසනවා ඇසිලා අම්මා ඇවිත් ඔලුව අතගාලා ගියා. එයා ගිය තැනකින් ආපහු ඇවිල්ල ඇති කියලා මම පහුවදාත් බබල් ව හෙව්වා. ඒත් එයා හමුවුනේම නැහැ.එයා නැතිවුනේ කොහොමද කියලා මම නොයෙක් විධියට හිතුවා. බබල් කාණුවකට රිංගුවාද, කපුටෙක් ගෙන ගියාද, ගැරඬියෙක් ගිල්ලාද, හිතාගන්න බෑ. කොහොම වුනත් මගේ හිතේ සතුට නම් නැතිවෙලා. මං කල්පනා කරකර අහස දෙස බලන් හිටියා.

"මගෙ පුතේ මේ ලෝකෙට දේවල් ඇතිවනවා වගේම ඇතිවන දේවල් නැතිවනවා. අපි කැමති

අය නැතිවෙනවා, අපෙන් වෙන්ව යනවා. ඒක තමයි ලෝක සොබාව. දුක් වෙන්න එපා රත්තරං පුතේ" කියලා අත්තම්මා මගේ ඔලුව අතගෑවා.

අත්තම්ම කියන දේ හරි. මගෙ බබල් ආයෙමත් එන එකක් නැහැ. හැබැයි එයා නිදහසේ සතුටින් කොහේ හරි ඇති කියල මට හිතෙනව. එහෙනම් බබල් ඔයාට ආයුබෝවන්! සතුටින් ඉන්න. මම ඔයාට තාමත් ගොඩාරියක් ආදරෙයි.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්